22 AUG 1995

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 ජූනි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 2.10 යි. තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

# 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1995 ජූනි මස 30 වන දින]

එල්. ඩී.—ඔ. 10/93

3. බේරුම්කිරීමේ නිති කෘත්‍ය පවත්වාගෙන යාම සඳහාද ; විදේශ බේරුම් තීරණ පිළිගැනීමේ හා බලාත්මක කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද ; (98 වන අධිකාරය වූ) බේරුම් කිරීමේ ආඥා පනත සහ (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ඇතැම් වගන්ති ඉවත් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

බේරුම් කිරීමේ නීති කෘත්‍ය පවත්වාගෙන යාම සහ ඒ යටතේ කරන ලද තීරණ බලාත්මක කිරීම සඳහා පරිපූරණ නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද ; පූර්විකාව

1958 විදේශ බේරුම් තීරණ පිළිගැනීමේ හා බලාත්මක කිරීමේ සම්මුතියේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම පිණිස නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### ප්‍රාරම්භය

2. (1) බේරුම් කිරීමේ නීති කෘත්‍ය ආරම්භ වූයේ කවර බේරුම් කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව ද ඒ ගිවිසුමට ඇතුළත් වූයේ නියමිත දිනයට පෙර හෝ පසුව හෝ වුවද, නියමිත දිනයට පසුව ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද සියලු බේරුම් කිරීමේ නීති කෘත්‍ය කෙරෙහි මේ පනතේ විධිවිධාන 48 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අදාළ විය යුතු ය. අදාළ කිරීම.

(2) පාර්ශ්වකරුවන් අන්‍යාකාරයෙන් එකඟ වුවහොත් මිස, නියමිත දිනයට පෙරාතුව බේරුම් කිරීමේ නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබ ඇති අවස්ථාවක, නියමිත දිනයට පෙරාතුව බලාත්මකව පැවති නීතිය, ඒ බේරුම් කිරීමේ නීති කෘත්‍ය කෙරෙහි අදාළ විය යුතු ය.

(3) බේරුම් කිරීමේ ගිවිසුමකට (ජනරජයේ අයිතියක් ප්‍රකාර හෝ වෙනත් යම් තත්ත්වයකින්) රජය පාර්ශ්වකරුවකු වන අවස්ථාවක, රජය, මේ පනතේ විධිවිධානවලින් බැඳී සිටිය යුතු ය

## II වන කොටස

### බේරුම් කිරීමේ ගිවිසුම

බේරුම් කිරීමේ ගිවිසුමේ ආකාරය.

3. (1) බේරුම් කිරීමේ ගිවිසුම, කොන්ත්‍රාත්තුවක ඇතුළත් වන බේරුම් කිරීමේ වගන්තියක ආකාරයෙන් හෝ වෙනම වූ ගිවිසුමක ආකාරයෙන් විය හැකි ය.

(2) බේරුම් කිරීමේ ගිවිසුමක් ලියවිල්ලකින් විය යුතු ය. ගිවිසුමක් පාර්ශ්වකරුවන් විසින් අත්සන් කරන ලද ලියවිල්ලක හෝ ගිවිසුම පිළිබඳ ලේඛනගතවීමක් සලස්වා ඇති ලිපි හුවමාරුවක, ටෙලෙක්ස් පණිවුඩවල, විදුලි පණිවුඩවල හෝ වෙනත් විදුලි සංදේශ මාර්ගයක අන්තර්ගත වන්නේ නම්, ඒ ගිවිසුම ලියවිල්ලකින් ඇති සේ සලකනු ලැබිය යුතු ය.

ආරාවුල පිළිබඳ බේරුම් කාරත්මක භාවය.

4. බේරුම් කිරීමේ ගිවිසුමක් යටතේ බේරුම් කිරීමට ඉදිරිපත් කිරීමට පාර්ශ්වකරුවන් එකඟ වී ඇති යම් ආරාවුලක්, බේරුම් කිරීමේ ගිවිසුමට ඇතුළත් වූයේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණය රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන්නේ නම් හෝ බේරුම් කිරීමකින් තීරණය කිරීමට නොහැකි වන්නේ නම් හෝ මිස බේරුම් කිරීම මගින් තීරණය කරනු ලැබිය හැකි ය.

බේරුම් කිරීමේ ගිවිසුමෙන් ආවරණය වූ ආරාවුල සම්බන්ධයෙන් අධිකරණයේ අධිකරණ බලය.

5. බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවකු විසින්, ඒ ගිවිසුම යටතේ බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කිරීමට එකඟ වී ඇති කාරණයක් සම්බන්ධයෙන් ඒ ගිවිසුමේ වෙනත් පාර්ශ්වකරුවකුට විරුද්ධව අධිකරණයක් හමුවේ නඩු කටයුතු පවරනු ලබන අවස්ථාවක, ඒ කාරණය සම්බන්ධයෙන් අධිකරණය විසින් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ වෙනත් පාර්ශ්වකරු විසින් විරෝධය පළ කරනු ලැබුවහොත්, ඒ කාරණය අසා තීරණය කිරීමට අධිකරණයට අධිකරණ බලය නොතිබිය යුතු ය.

## III වන කොටස

### බේරුම්කාර විනිශ්චයාධිකාරයේ සංයුතිය

බේරුම්කරුවන් සංඛ්‍යාව.

6. (1) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බේරුම්කාර විනිශ්චයාධිකාරයක බේරුම්කරුවන් සංඛ්‍යාව තීරණය කිරීමට පාර්ශ්වකරුවන්ට නිදහස තිබිය යුතු ය.

(2) එවැනි තීරණයක් කරනු නොලැබූ අවස්ථාවක, බේරුම්කරුවන්ගේ සංඛ්‍යාව තුනක් විය යුතු ය.

(3) පාර්ශ්වකරුවන් විසින් බේරුම්කරුවන් ඉරට්ටේ ගණනක් පත් කරනු ලැබූ අවස්ථාවක, එසේ පත් කරන ලද බේරුම්කරුවන් විසින් එක්ව අතිරේක බේරුම්කරුවකු පත් කර ගත යුතු අතර, ඒ බේරුම්කරු එහි සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු ය.

බේරුම්කරුවන් පත් කිරීම.

7. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, බේරුම්කරුවන් පත් කර ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹීමට පාර්ශ්වකරුවන්ට නිදහස ඇත්තේ ය.

(2) එසේ එකඟවීමක් නොමැති විට—

(අ) තනි බේරුම්කරුවකුගෙන් යුත් බේරුම් කිරීමක දී, බේරුම්කරු සම්බන්ධයෙන් එකඟත්වයට එළඹීමට පාර්ශ්වකරුවන්ට නොහැකි වුවහොත්, පාර්ශ්ව කරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ බේරුම්කරු මහාධිකරණය විසින් පත් කරනු ලැබිය යුතු ය ;

(ආ) බේරුම්කරුවන් තුන්දෙනකු ගෙන් යුත් බේරුම් කිරීමක දී, එක් එක් පාර්ශ්වකරුවකු විසින් එක් බේරුම්කරුවකු බැගින් පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන බේරුම්කරුවන් දෙදෙනා විසින් තුන්වන බේරුම්කරු පත් කරනු ලැබිය යුතු ය ; පාර්ශ්වකරුවෙක්, බේරුම්කරුවකු පත් කරන ලෙස අනික් පාර්ශ්වකරුගෙන් ඉල්ලීමක් ලැබී දින හැටක් ඇතුළත බේරුම්කරුවකු පත් කිරීම පැහැර හැරියහොත් හෝ බේරුම්කරුවන් දෙදෙනා, ඔවුනගේ පත්වීමේ දින සිට දින හැටක් ඇතුළත තුන්වන බේරුම්කරු සම්බන්ධයෙන් එකඟත්වයට එළඹීමට අසමත් වුවහොත්, පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඒ බේරුම්කරු මහාධිකරණය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) පාර්ශ්වකරුවන් විසින් එකඟත්වයට එළඹ ඇති පත් කිරීමේ කාර්ය පටිපාටිය යටතේ—

(අ) ඒ කාර්ය පටිපාටිය යටතේ නියම කළ හැකි පරිදි ක්‍රියා කිරීම පාර්ශ්වකරුවකු විසින් පැහැර හරින අවස්ථාවක ; හෝ

(ආ) ඒ කාර්ය පටිපාටිය යටතේ ඔවුන්ට නියම කර ඇති එකඟත්වයට එළඹීමට පාර්ශ්වකරුවන්ට හෝ බේරුම්කරුවන්ට නොහැකිවන අවස්ථාවක ; හෝ

(ඇ) ඒ කාර්ය පටිපාටිය යටතේ, ආයතනයක් ද ඇතුළුව ඒ තුන්වන පාර්ශ්වකරුට පවරනු ලබන යම් කර්තව්‍යයක් ඉටුකිරීමට ඒ තුන්වන පාර්ශ්වකරු පැහැර හරින අවස්ථාවක

බේරුම්කරු හෝ බේරුම්කරුවන් පත් කිරීම අරභයා අවශ්‍ය පියවර ගැනීම පිණිස කවර හෝ පාර්ශ්වකරුවකු විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) මහාධිකරණය විසින් බේරුම්කරුවකු පත් කිරීමේ දී පාර්ශ්ව කරුවන් අතර වූ ගිවිසුම යටතේ බේරුම්කරුවකුට තිබිය යුතු යයි නියම කර ඇති යම් සුදුසුකම් කෙරෙහි සහ ස්වාධීන සහ අපක්ෂපාත බේරුම්කරුවකුගේ පත් කිරීමක් සහතික කිරීමට ඉවහල් වන්නා වූ කරුණු කෙරෙහි මහාධිකරණය නිසි සැලකිල්ල දැක්විය යුතු ය.

**බේරුම් කරුවකුගේ අධිකාරය අවසන් කිරීම හා බේරුම්කරු ඉවත් කිරීම.**

8. (1) බේරුම්කරුවකුට, ඒ ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වුවහොත් හෝ වෙනත් යම් හේතුවක් නිසා අනිසි ප්‍රමාද යකින් තොරව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් නැතහොත් මියගිය හොත් හෝ ධුරයෙන් ඉවත් වුවහොත් නැතහොත් අවසන් කිරීම පිළිබඳව පාර්ශ්වකරුවන් එකඟ වුවහොත් බේරුම්කරුවකුගේ අධි කාරය අවසන් විය යුතු ය.

(2) බේරුම්කරුවකු විසින් ස්වකීය ධුරයේ කාර්යයන් ඉටු කිරීම අනිසි ලෙස ප්‍රමාද කරන අවස්ථාවක, පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණය විසින් ඒ බේරුම්කරු ධුරයෙන් ඉවත් කොට ඔහු වෙනුවට වෙනත් බේරුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, පාර්ශ්වකරුවන් එසේ එකඟත්වයකට එළඹ ඇති අවස්ථාවක, ඒ ඉවත් කිරීම හා පත් කිරීම බේරුම් කිරීමේ ආයතන යක් විසින් කරනු ලැබිය යුතු ය.

(3) බේරුම්කරුවකුගේ අධිකාරය අවසන් කරනු ලැබූ අවස්ථා වක පාර්ශ්වකරුවන් අන්‍යාකාරයෙන් එකඟවන්නේ නම් මිස, නීති කෘත්‍ය මූල සිට නොපැවැත්විය යුතු ය.

**ආදේශිත බේරුම්කරුවකු පත් කිරීම.**

9. 8 වන වගන්තිය යටතේ බේරුම්කරුවකුගේ අධිකාරය අව සන් වන අවස්ථාවක, ඒ අධිකාරය අවසන් වූ බේරුම්කරු පත් කිරීමට අදාළ වූ ආකාරයටම ආදේශිත බේරුම්කරුවකු පත් කරනු ලැබිය යුතු ය.

**අභියෝග ඉදිරිපත් කිරීම සඳහා හේතු.**

10. (1) බේරුම්කරුවකු ලෙස පත්වීමක් භාර ගන්නා මෙන් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි අවස්ථාවක, ඔහු විසින් පළමුවෙන් ම, ඔහුගේ අපක්ෂපාතීත්වය කෙරෙහි හෝ ස්වාධීනත්වය කෙරෙහි සාධාරණ සැක මතුවීමට ඉඩ ඇති යම් අවස්ථාගත කරුණු හෙළිදරව් කළ යුතු ය; තවද තමාගේ පත් වීමේ වේලාවේ සිට බේරුම්කාරාත්මක නීති කෘත්‍ය පවත්නා සම්පූර්ණ කාලය තුළ, බේරුම්කරුවකු විසින් එවකටත් එසේ දැනුම් දෙනු ලැබ ඇත්නම් මිස, මේ උපවගන්තියේ සඳහන් අවස්ථාගත කරුණු අප්‍රමාදව සියලු පාර්ශ්වකරුවන්ට සහ අනික් පාර්ශ්වකරු වන්ට හෙළිදරව් කළ යුතු ය.

(2) බේරුම්කරුවකුගේ අපක්ෂපාතීත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳව සාධාරණ සැක මතු වන්නා වූ අවස්ථාගත කරුණු පව තින්නේ නම් පමණක් බේරුම්කරුවකුට විරුද්ධව අභියෝග ඉදිරි පත් කරනු ලැබිය හැකි ය. පාර්ශ්වකරුවකුට තමා විසින් පත් කරනු ලැබූ බේරුම්කරුවකුට විරුද්ධව හෝ තමා සහභාගිවූයේ යම් බේරුම්කරුවකුගේ පත් කිරීමකට ද ඒ බේරුම්කරුට විරුද්ධව, පත්වීම් කිරීමෙන් පසු තමාට දැනගන්නට ලැබෙන කරුණු උදෙසා පමණක් අභියෝග ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) තීරණය, වෙනත් යම් තැනැත්තකු විසින් ගතයුතු බවට පාර්ශ්වකරුවන් තීරණය කර ඇත්නම් මිස, බේරුම්කරුවකුට විරුද්ධව අභියෝග ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්ව කරුවකු විසින් බේරුම්කරුගේ අපක්ෂපාතිත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳව සැක මතුවීමට තුඩු දෙන්නා වූ අවස්ථාගත කරුණු තමාට දැනගැනීමට ලැබීමෙන් දින තිහක් ඇතුළත, පළමුවෙන් බේරුම්කාර විනිශ්චයාධිකාරය වෙත එසේ අභියෝග ඉදිරිපත් කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ බේරුම්කාර විනිශ්චයාධිකාරයක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන පාර්ශ්වකරුවකු ඒ ඉල්ලීම සම්බන්ධයෙන් වූ විනිශ්චයාධිකාරය විසින් කරනු ලබන නියමය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන අවස්ථාවක, ඔහු විසින් ඒ තීරණය ලැබී දින තිහක් ඇතුළත, ඒ නියමයට විරුද්ධව මහාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

## IV වන කොටස

### බේරුම්කාර විනිශ්චයාධිකාරයේ අධිකරණ බලය

බේරුම්කාර විනිශ්චයාධිකාරයේ පරිමිත බලය.

**11.** (1) බේරුම් කිරීමේ ගිවිසුමේ පැවැත්ම හෝ එහි වලංගුභාවය සම්බන්ධයෙන් හෝ ඒ ගිවිසුම රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි ද යන වග හෝ ඉටු කරනු ලැබීමට නොහැකි ද යන වග සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයක් ද ඇතුළුව, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් එහි අධිකරණ බලය පිළිබඳ තීරණය කරනු ලැබිය හැකි නමුත් එවැනි යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණයක් කිරීම සඳහා බේරුම්කාර නීති කෘත්‍යයක යම් පාර්ශ්වකරුවකු විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, මහාධිකරණය විසින් ඒ ප්‍රශ්නය පිළිබඳ තීරණයක් කරනු ලබන තෙක් බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් බේරුම් කිරීමේ නීති කෘත්‍ය දිගටම පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

ගිවිසුමක් කොටස් වලට වෙන් කළ හැකි බව.

**12.** බේරුම්කාර විනිශ්චයාධිකාරයේ අධිකරණ බලය තීරණය කිරීමේ කාර්යය සඳහා බේරුම් කිරීමේ ගිවිසුමක වලංගුභාවය පිළිබඳව තීරණයක් කරනු ලබන විට, වෙනත් ගිවිසුමක කොටසක් සෑදෙන්නා වූ බේරුම් කිරීමේ ගිවිසුමක් වෙනම ගිවිසුමක් ස්ථාපනය කරන ලෙස සලකනු ලැබිය යුතු ය.

ආරක්ෂා කිරීමේ අතුරු පියවර.

**13.** (1) පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් ආරාවුලේ විෂය කාරණය සංයුක්ත වන හිමිකම් පෑම ආරක්ෂා කිරීම හෝ සුරක්ෂිත කිරීම පිණිස අවශ්‍ය වන්නේ යයි එය විසින් සලකනු ලබන අතුරු පියවර ගන්නා ලෙස වෙනත් යම් පාර්ශ්වකරුවකුට නියම කරනු ලැබිය හැකි ය. එවැනි අතුරු පියවර ගැනීමේ දී සිදුවිය හැකි යම් වියදමක්, පාඩුවක් හෝ අලාභයක් සඳහා, එවැනි අතුරු පියවර ගැනීමට නියම කරනු ලැබූ පාර්ශ්වකරු වෙත ඇප සපයන ලෙස ඒ ඉල්ලීම කරන පාර්ශ්වකරුට බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් නියම කරනු ලැබිය හැකි ය;

එසේ වුවද, අතිවිශේෂ අවස්ථාගත කරුණු යටතේ හැර, අනෙක් පාර්ශ්වකරුවන්ගෙන් කරුණු විමසීමෙන් පසුව හැර, ඒ නියමය කරනු නොලැබිය යුතු ය.

(2) අතුරු පියවර ගැනීමට නියම කරන බේරුම්කාර විනිශ්චයාධිකාරයක නියමයක්, ඒ අතුරු පියවර ගැනීමට ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින් තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, මහාධිකරණය විසින් බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) අතුරු පියවර බලාත්මක කිරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ මහාධිකරණය වෙත කරන ලද ඉල්ලීමක්, 5 වන වගන්තිය හෝ බේරුම් කිරීමේ ගිවිසුම හෝ ගිවිසුම අත්හැරීමක් සමග නොගැළපෙන සේ සලකනු නොලැබිය යුතු ය.

සමථයකට පත් කිරීම.

**14.** (1) බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් ආරාවුල සමථයකට පත් කර ගැනීමෙහි ලා උනන්දු කරවීමේ බේරුම් කිරීමේ නීති කෘත්‍ය සමග නොගැළපීමක් නොවිය යුතු අතර, පාර්ශ්වකරුවන්ගේ එකඟත්වය ඇතිව, බේරුම්කාර නීති කෘත්‍යයේ ඕනෑම වේලාවක දී බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් සමථයකට පත් කර ගැනීමෙහි ලා උනන්දු කරවීම පිණිස, මැදිහත්වීම, සන්ධානය හෝ වෙනත් යම් ක්‍රියා මාර්ගයක් භාවිත කරනු ලැබිය හැකි ය.

(2) බේරුම්කාර නීති කෘත්‍ය අතරතුර දී පාර්ශ්වකරුවන් විසින් ආරාවුල සමථයකට පත් කර ගනු ලැබුවහොත්, පාර්ශ්වකරුවන් විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් ඒ සමථයට පත් කිරීම, එකඟත්වයට එළඹුණු නියමයක් මත කරන ලද බේරුම්කාර තීරණයක ආකාරයෙන් වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(3) එකඟත්වයට එළඹුනු නියමයක් මත කරන ලද බේරුම්කාර තීරණයක්, 25 වන වගන්තියට අනුව කළ යුතු අතර, එය එකඟත්වයට එළඹුනු නියමයක් මත කරන ලද බේරුම්කාර තීරණයක් බව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) එකඟත්වයකට එළඹුනු නියමයක් මත කරන ලද බේරුම්කාර තීරණයකට, ආරාවුල සම්බන්ධයෙන් කරන ලද වෙනත් යම් බේරුම්කාර තීරණයක තත්ත්වය සහ බලපෑම ම ඇත්තේ ය.

## V වන කොටස

### බේරුම් කිරීමේ නීති කෘත්‍ය පවත්වාගෙන යාම

බේරුම්කාර විනිශ්චයාධිකාරයේ කාර්ය.

**15.** (1) බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින්, බේරුම් කිරීම සඳහා එය වෙත ඉදිරිපත් කරන ලද යම් ආරාවුලක් සම්බන්ධයෙන් අපක්ෂපාති, ප්‍රායෝගික හා කඩිනම් ආකාරයෙන් ක්‍රියා කළ යුතු ය.

(2) බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින්, සියලු පාර්ශ්වකරුවන්ට තම තමන්ගේ ඒ ඒ කියාපෑම් ලියවිල්ලකින් හෝ වාචිකව ඉදිරිපත් කිරීම පිණිස සහ වෙනත් පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එය වෙත සපයා ඇති සියලු ලේඛන සහ වෙනත් දේ පරීක්ෂා කිරීම පිණිස අවස්ථාවක් සලසා දිය යුතු ය. පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් එය ඉදිරියෙහි ඇති යම් ප්‍රශ්නයක් තීරණය කිරීමට පෙර වාචිකව කරුණු විමසීමක් කරනු ලැබිය හැකි ය.

(3) පාර්ශ්වකරුවකු විසින් සාධාරණ හේතුවක් නොමැතිව බේරුම්කාර විනිශ්චයාධිකාරයක් ඉදිරියෙහි පෙනී සිටීම හෝ එය විසින් කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුව ද, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් බේරුම්කාර නීති කෘත්‍ය දිගට ම පවත්වාගෙන යනු ලැබිය හැකි අතර, එයට ලබාගත හැකි කරුණු මත ආරාවුල තීරණය කළ හැකි ය.

(4) සහන සඳහා වූ අයැදීම් බේරුම් කිරීමේ ගිවිසුමේ විෂය පථයට අයත් වන්නේ නම් සහ ඒ සහන ඉදිරිපත් කරන වේලාව පිළිබඳව සහ වෙනත් අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන ඒ සහන පිළිගැනීම අනුචිත නොවන්නේ නම් පාර්ශ්වකරුවන් විසින් සහන සඳහා අලුත් අයැදීම් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ නීති කෘත්‍ය පවත්වාගෙන යන අතරතුර දී, දෙපාර්ශ්වකරුවන්ගෙන් කවර හෝ පාර්ශ්වකරුවකු විසින්, ඒ හා සමාන කොන්දේසි මත, කලින් ඉදිරිපත් කරන ලද සහන සඳහා වූ අයැදීම් සංශෝධනය කිරීම හෝ එකතු කිරීම් කළ හැකි අතර, ඔවුන් ඒ ඒ කියාපෑම් තහවුරු කිරීමෙහි ලා අලුත් අවස්ථාගත කරුණු කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය.

බේරුම් කිරීමේ ස්ථානය.

**16.** (1) බේරුම් කිරීමේ නීති කෘත්‍යයක පාර්ශ්වකරුවන්ට බේරුම් කිරීම පවත්වන ස්ථානය පිළිබඳව එකඟත්වයට එළඹීමට නිදහස තිබිය යුතු ය. එවැනි එකඟත්වයකට එළඹීමට අසමත් වුව හොත්, පාර්ශ්වකරුවන්ගේ පහසුව ද ඇතුළුව කාරණයේ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, බේරුම් කිරීම පවත්වන ස්ථානය බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) බේරුම් කිරීම පවත්වන ස්ථානය පිළිබඳව ඉඩ සලස්වන (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ වුවද, පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයට එළඹ ඇත් නම් මිස, තම සාමාජිකයන් අතර පිළිවිමසීම් සඳහා හෝ සාක්ෂිකරුවන්, විශේෂඥයන් හෝ පාර්ශ්වකරුවන් විමසීම සඳහා හෝ භාණ්ඩ, වෙනත් දේපළ හෝ ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහා බේරුම්කාර විනිශ්චයාධිකාරය උචිත යයි සලකන යම් ස්ථානයක දී එයට රැස්විය හැකි ය.

පටිපාටිය පිළිබඳ රීති නිරණය කිරීම.

17. මේ පනතේ විධිවිධානවලට යටත්ව, නීති කෘත්‍ය පවත්වා ගෙන යාමේ දී බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව එකඟත්වයට පැමිණීමට පාර්ශ්වකරුවන්ට නිදහස තිබිය යුතු ය. බේරුම්කාර විනිශ්චයාධිකාරය වෙත පවරා දී ඇති බලතලවලට, යම් සාක්ෂියක ආවේශ්‍යතාව, අදාළවීම සහ ප්‍රබලතාව තීරණය කිරීමේ බලය ද ඇතුළත් විය යුතු ය.

බේරුම්කාර නීති කෘත්‍ය ආරම්භ කිරීම.

18. (අ) ප්‍රස්තුත බේරුම් කිරීමේ ගිවිසුම අදාළ වන ආරාවුලක් පැන නැගී ඇත්තේ නම්, සහ

(ආ) ගිවිසුමේ පාර්ශ්වකරුවකුට—

(i) බේරුම් කිරීම පිණිස වූ ආරාවුල යොමු කිරීමේ දී විමසන ලෙසට හෝ විචාරණය කරන ලෙසට ඒ පාර්ශ්වකරුට නියම කරමින් ගිවිසුමේ වෙනත් පාර්ශ්වකරුවකුගෙන් දැන්වීමක් ලැබී ඇත් නම්; හෝ

(ii) ආරාවුලට අදාළව, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් පත් කරන ලෙසට හෝ බේරුම්කාර විනිශ්චයාධිකාරයක් පත් කිරීමෙහි ලා සම්බන්ධ වන ලෙසට හෝ එය විචාරණය කරන ලෙසට හෝ අනුමත කරන ලෙසට නියම කරමින් ඒ පාර්ශ්වකරුට ගිවිසුමේ වෙනත් පාර්ශ්වකරුවකුගෙන් දැන්වීමක් ලැබී ඇත් නම්

බේරුම් කිරීමක් ආරම්භව ඇතැයි සලකනු ලැබිය යුතු ය.

තීරණ ගනු ලබන්නේ කවර ආකාරයකට ද යන වග

19. (1) බේරුම් කිරීමේ ගිවිසුමේ පටහැනි අදහසක් ප්‍රකාශ කර ඇත් නම් මිස, බේරුම්කාර නීති කෘත්‍ය පවත්වනු ලබන අතරතුර දී බේරුම්කරුවන් බහුතරයක් විසින් කරන ලද යම් තීරණයක් සහ බහුතරයක් නොමැත්තේ නම් අනෙකුත් බේරුම්කරුවන් විසින් පත් කරන ලද බේරුම්කරුගේ තීරණය හෝ බේරුම් කිරීමේ ගිවිසුම හෝ මේ පනත ප්‍රකාර සභාපතිවරයෙක් සිටින අවස්ථාවක, ඒ සභාපතිවරයාගේ තීරණය, අනුගම්‍ය විය යුතු ය.

(2) බේරුම්කාර විනිශ්චයාධිකාරයක සභාපතිවරයකු සිටින අවස්ථාවක, බේරුම්කිරීමේ නීති කෘත්‍ය පරිපාලනය කිරීමේ සහ පවත්වා ගෙන යාමේ බලය සභාපතිවරයාට තිබිය යුතු ය.

පාර්ශ්වකරුවන් විසින් සිතාසි ලබා ගත හැකි බව.

20. (1) බේරුම්කාර විනිශ්චයාධිකාරයේ පූර්ව එකඟත්වය ලිඛිතව ලබා ගැනීමෙන් පසු බේරුම් කිරීමේ ගිවිසුමකට යම් පාර්ශ්වකරුවකු විසින්, විනිශ්චයාධිකාරය ඉදිරියෙහි විභාග කිරීම පිණිස තැනැත්තකුට පැමිණෙන ලෙස සහ සිතාසියේ නිශ්චිතව දක්වන් කරන යම් ලේඛනයක් හෝ දෙයක් විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කරන ලෙස නියම කරමින්, සිතාසි නිකුත් කිරීම සඳහා මහාධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) අධිකරණය ඉදිරියෙහි ඇති නඩුවක නඩු විභාගයක දී උත්තර දෙන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට යම් බල කළ නොහැකි යම් ප්‍රශ්නයකට උත්තර දෙන ලෙස හෝ යම් ලේඛන යක් හෝ දෙයක් ඉදිරිපත් කරන ලෙස, (1) වන උපවගන්තිය අනුව නිකුත් කරනු ලබන යම් සිතාසියක් යටතේ, ඒ තැනැත්තාට බල කරනු නොලැබිය යුතු ය.

බේරුම්කාර විනිශ්චයාධිකාරයක් ඉදිරියට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම.

21. (1) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟගත්වයට එළඹ ඇත්නම් මිස, බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවකු නොවන යම් තැනැත්තකු විසින්—

(අ) බේරුම්කාර විනිශ්චයාධිකාරය ඉදිරියෙහි විභාග කිරීම සඳහා පැමිණ සිටින ලෙස සිතාසි යටතේ හෝ බේරුම් කිරීමේ විනිශ්චයාධිකාරය විසින් නියම කර ඇති විට එසේ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින අවස්ථාවක ;

(ආ) බේරුම්කාර විනිශ්චයාධිකාරය ඉදිරියෙහි සාක්ෂිකරුවකු ලෙස පෙනී සිටිමින්—

(i) දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දෙන ලෙස හෝ දිවුරුම් ප්‍රකාශයක් කරන ලෙස විනිශ්චයාධිකාරය විසින් නියම කර ඇති විට, එසේ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(ii) උත්තර දෙන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් සාක්ෂිකරුට නියම කරන ප්‍රශ්නයකට උත්තර දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(iii) ඉදිරිපත් කරන ලෙස සිතාසි යටතේ හෝ විනිශ්චයාධිකාරය විසින් හෝ නියම කරන ලද ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින

අවස්ථාවක ; හෝ

(ඇ) විනිශ්චයාධිකාරයක් විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දෙයක් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින අවස්ථාවක,

බේරුම් කිරීමේ නීති කෘත්‍යයක පාර්ශ්වකරුවකු විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලබන්නේ නම්, විභාග කිරීම සඳහා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස හෝ ඒ ප්‍රස්තුත ලේඛනය හෝ දෙය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස හෝ යම් අදාළ දෙයක් කරන ලෙස මහාධිකරණය විසින් පැහැර හරින්නාට නියම කරනු ලැබිය හැකි ය.

(2) අනික් පාර්ශ්වකරුවන්ට දැන්වීමක් කිරීමෙන් පසු හැර සහ බේරුම්කාර විනිශ්චයාධිකාරයේ පූර්ව එකඟත්වය හෝ කැමැත්ත ඇතිව හැර, එවැනි ඉල්ලීමක් නොකළ යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීම අවස්ථාගත කරුණු අනුව අවශ්‍ය යයි අධිකරණය විසින් පැහැර හරින්නාගෙන් කරුණු විමසීමෙන් පසුව සලකන්නේ නම් මිස, එවැනි ආඥාවක් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් අඥාවක් කරනු ලබන අවස්ථාවක, ඊට අමතරව—

(අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රකාරව දෙන ලද යම් සාක්ෂියක වාර්තාවක් ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රකාරව ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් හෝ දෙයක් හෝ එවැනි යම් ලේඛනයක පිටපතක් ; හෝ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රකාරව කරන ලද යම් දෙයක් පිළිබඳ විස්තර

බේරුම්කාර විනිශ්චයාධිකාරය වෙත ප්‍රේෂණය කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු අතර, ඒ සාක්ෂිය, ලේඛනය හෝ දෙය, අවස්ථාවෝචිත පරිදි ඒ බේරුම් කිරීමේ නීති කෘත්‍ය පවත්වාගෙන යන අතරතුර දෙන ලද සාක්ෂියක්, ඉදිරිපත් කරන ලද ලේඛනයක් හෝ කරන ලද දෙයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

බේරුම්කාර විනිශ්චයාධිකාරය ඉදිරියෙහි සාක්ෂි.

22. (1) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයකට එළඹ ඇත් නම් මිස, බේරුම්කාර විනිශ්චයාධිකාරය ඉදිරියෙහි දෙනු ලබන සාක්ෂි වාචිකව, ලියවිල්ලකින් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් දිය හැකි ය.

(2) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයකට එළඹ ඇත් නම් මිස, ගිවිසුම යටතේ නීති කෘත්‍ය කරගෙන යාමේ කාර්ය සඳහා බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දීම හෝ දිවුරුම් ප්‍රකාශයක් කිරීම කළ හැකි ය.

(3) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයකට එළඹ ඇත් නම් මිස, බේරුම් කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව නීති කෘත්‍ය පවත්වාගෙන යාමේ දී බේරුම්කාර විනිශ්චයාධිකාරයක් සාක්ෂි ආඥාපනතේ විධිවිධානවලින් බැඳී නොසිටින්නේ ය.

නියෝජනය කිරීම.

23. බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් ලියවිල්ලකින් අන්‍යාකාරයෙන් එකඟත්වයට එළඹ ඇත් නම් මිස, බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවකු විසින්—

(අ) බේරුම්කාර විනිශ්චයාධිකාරය ඉදිරියෙහි පුද්ගලිකව පෙනී සිටීම හෝ පාර්ශ්වකරු සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක්වන අවස්ථාවක, ඒ මණ්ඩලයේ නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු මගින් පෙනී සිටීම හෝ කළ හැකි ය ;

තවද

(ආ) පාර්ශ්වකරු එසේ කිරීමට කැමැත්තේ නම් නීතිඥවරයකුගේ මාර්ගයෙන් නියෝජනය කරනු ලැබිය හැකි ය.

ආරාවුලේ හරයට අදාළ විය යුතු නීතිය.

24. (1) ආරාවුලේ හරයට අදාළවන බවට පාර්ශ්වකරුවන් විසින් තෝරා ගනු ලබන නීතියේ රීති අනුව බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් ආරාවුල තීරණය කළ යුතු ය. අන්‍යාකාරයෙන් ප්‍රකාශ කර

ඇත් නම් මිස, යම් රාජ්‍යයක නීති නිර්දිෂ්ට හෝ නීති ක්‍රමය, ඒ රාජ්‍යයේ නීති පිළිගැටුම් පිළිබඳ රීතිවලට නොව, ඒ රාජ්‍යයේ හරවත් නීතියට යොමු කිරීමෙන් තේරුම් ගනු ලැබිය යුතු ය.

(2) බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවන් විසින් යම් නිර්දිෂ්ට කිරීමක් කිරීමට අපොහොසත් වීමේදී, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් අදාළවන්නේ යයි සලකනු ලබන නීති ගැටුම් පිළිබඳ රීති වලින් තිරණය වූ නීතිය බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් අදාළ කරගත යුතු ය.

(3) (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන, පාර්ශ්ව කරුවන් විසින් එකගත්වයට එළඹ ඇති ප්‍රමාණයට පමණක් අදාළ විය යුතු ය.

(4) පාර්ශ්වකරුවන් විසින් ප්‍රකාශිතව ම එසේ කරන ලෙස බලය දී ඇත් නම් පමණක්, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් සාමාන්‍ය යුක්තිය සහ සාධාරණත්වය පිළිබඳ හෝ වෙළෙඳ පරිචය පිළිබඳ සලකා බැලීම අනුව තීරණය කළ යුතු ය.

## VI වන කොටස

### තීරණ

තීරණයේ ආකාරය හා අන්තර්ගත කරුණු.

25. (1) තීරණය ලියවිල්ලකින් කළ යුතු අතර, බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය කෙරුණු බේරුම්කරුවන් විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය. එක් බේරුම්කරුවකුට වැඩි ගණනක් ඕවිත බේරුම්කාර නීති කෘත්‍යයක දී බේරුම්කාර විනිශ්චයාධිකාරයේ බේරුම්කරුවන් බහුතර සංඛ්‍යාවකගේ අත්සන් ප්‍රමාණවත් විය යුතු ය; එසේ වුව ද අත්හැර ඇති යම් අත්සනක් සඳහා හේතුව සඳහන් කර තිබිය යුතු ය.

(2) හේතු කිසිවක් නොදැක්විය යුතු බවට පාර්ශ්වකරුවන් එකගත්වයකට එළඹ ඇත් නම් මිස, නැතහොත් තීරණය 14 වන වගන්තිය යටතේ එකගත්වයට එළඹ ඇති නියම මත කරන ලද තීරණයක් නම් මිස, තීරණය පදනම්ව ඇත්තේ යම් හේතු මත ද ඒ හේතු තීරණයක සඳහන් විය යුතු ය.

(3) 16 වන වගන්තිය අනුව, නිශ්චය කරන ලද පරිදි තීරණයක එහි දිනය සහ බේරුම් කිරීමේ ස්ථානය සඳහන්ව තිබිය යුතු ය. තීරණය ඒ ස්ථානයේ දී කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(4) තීරණය කිරීමෙන් පසු, මේ වගන්තියේ (1) වන උප වගන්තිය අනුව, බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය වූ බේරුම්කරුවන් විසින් අත්සන් කරන ලද පිටපතක්, එක් එක් පාර්ශ්වකරු වෙත භාර දිය යුතු ය.

තීරණය අවසානාත්මක විය යුතු බව.

26. මේ පනතේ VII වන කොටසේ විධිවිධානවලට යටත්ව, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් කරනු ලබන තීරණය, අවසානාත්මක විය යුතු අතර, බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්ව කරුවෝ ඒ තීරණයෙන් බැඳී සිටින්නාහ.

තීරණය නිවැරදි කිරීම හා අර්ථ නිරූපණය කිරීම ; අතිරේක තීරණය.

27. (1) පාර්ශ්වකරුවන් විසින් වෙනත් කාලසීමාවක් පිළිබඳව එකඟත්වයට එළඹ ඇත්නම් මිස, තීරණය ලැබී දින දාහතරක් ඇතුළත බේරුම්කාර විනිශ්චයාධිකාරයේ ඉල්ලීම පිට හෝ අන්‍යාකාරයෙන්—

(අ) පාර්ශ්වකරුවකු විසින්, අනිත් පාර්ශ්වකරුට දැන්වීමක් කරමින්—

(i) තීරණයෙහි ඇති ගණනය කිරීමේ යම් වැරදි, යම් ලිපිකරු හෝ මුද්‍රණ ශිල්පීය දෝෂ හෝ අත් හැරීමක් හෝ ඒ හා සමාන යම් වැරදි නිවැරදි කරන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරයෙන් ඉල්ලා සිටිය හැකි ය ; නැතහොත්

(ii) තීරණයේ කොටසක්, බේරුම් කිරීම පිණිස යොමු කරනු නොලැබූ කාරණයක් මත කර ඇති අවස්ථාවක, තීරණය සුළු වශයෙන් වෙනස් කරන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරයෙන් ඉල්ලා සිටිය හැකි ය : එසේ වුව ද, ඒ කොටස අනිත් කොටසින් වෙන් කළ හැකි කොටසක් විය යුතු අතර, එයින් යොමු කරන ලද කාරණය මත කර ඇති තීරණයට එයින් බලපෑමක් නොවිය යුතු ය.

(ආ) පාර්ශ්වකරුවන් විසින් එසේ එකඟත්වයකට එළඹ ඇත් නම්, පාර්ශ්වකරුවකු විසින් අනිත් පාර්ශ්වකරුට දැන්වීමක් සහිතව තීරණයේ නිශ්චිත ප්‍රශ්නයක හෝ තීරණයේ කොටසක අර්ථ නිරූපණයක් දෙන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) ඉල්ලීම යුක්ති සහගත යයි බේරුම්කාර විනිශ්චයාධිකාරය සලකන්නේ නම්, ඉල්ලීම ලැබී දින දාහතරක් ඇතුළත හෝ බේරුම්කාර විනිශ්චයාධිකාරයේ ඉල්ලීම පිට පාර්ශ්වකරුවන් එකඟත්වයට එළඹ ඇති යම් වැඩි දීර්ඝ කාලයක් ඇතුළත එය විසින් ඒ නිවැරදි කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ අර්ථ නිරූපණය කිරීම කළ හැකි ය. අර්ථ නිරූපණය තීරණයේ කොටසක් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් වන මුද්‍රණ ශිල්පීය අකුරුවල යම් වරදක් තීරණයේ දින සිට දින දාහතරක් ඇතුළත බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් සිය මෙහෙයීමෙන්ම නිවැරදි කළ හැකි ය.

(4) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයකට එළඹ ඇත්නම් මිස, පාර්ශ්වකරුවකු විසින් පාර්ශ්වකරුට දැන්වීමක් සහිතව, තීරණය ලැබී දින දාහතරක් ඇතුළත, බේරුම්කාර නීති කෘත්‍යවල දී ඉදිරිපත් කරන ලද එහෙත් තීරණයෙන් අත් හැර ඇති ඉල්ලීම් පිළිබඳව අතිරේක තීරණයක් කරන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරයෙන් ඉල්ලා සිටිය හැකි ය. අනික් පාර්ශ්වකරුවන් විභාග කිරීමෙන් පසු ඉල්ලීම සාධාරණ යයි බේරුම්කාර විනිශ්චයාධිකාරය සලකන්නේ නම්, විභාගය අවසන් කිරීමෙන් දින තිහක් ඇතුළත එය විසින් අතිරේක තීරණයක් කරනු ලැබිය හැකි ය.

(5) 26 වන වගන්තියේ විධිවිධාන තිරණයේ නිවැරදි කිරීමකට හෝ සුළු වශයෙන් වෙනස් කිරීමකට හෝ අර්ථ නිරූපණය කිරීමට හෝ අතිරේක තිරණයකට අදාළ විය යුතු ය.

පොලිය.

28. පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකඟත්වයට එළඹ ඇත්නම් මිස, මුදල් ගෙවීම සඳහා බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් (ප්‍රමාණ කළ හෝ ප්‍රමාණ නොකළ මුදලක් සඳහා වූ ඉල්ලීමක් මත වුවද) තිරණයක් කරන අවස්ථාවක, බේරුම් කිරීමේ නීති කෘත්‍ය පැවරීමට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා මුල් මුදල මත ප්‍රදානය කළ යම් පොලියකට අතිරේකව, බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් අතර එකඟත්වයට එළඹ ඇති අනු ප්‍රමාණය අනුව හෝ එවැනි යම් ගිවිසුමක් නොමැති නම්, බේරුම්කාර තිරණය කරන ලද අවස් ථේදී පැවති නෛතික පොලිය අනුව, බේරුම් කිරීමේ නීති කෘත්‍ය ආරම්භ වූ දිනයේ සිට තිරණය කරන ලද දිනය දක්වා ප්‍රදානය කර ඇති මුල් මුදල මත පොලිය, එසේ තීරණය කරන ලද, මුළු මුදල මත තිරණය කරන ලද දිනයේ සිට ඒ මුදල ගෙවන ලද දිනය දක්වා හෝ බේරුම්කාර විනිශ්චය ධිකාරය සුදුසු යයි කල්පනා කරනු ලබන යම් කලින් වූ දිනයක් දක්වා ඉහත කී අනුප්‍රමාණය මත වූ වැඩිදුර පොලියක් ද සමග ගෙවිය යුතු බවට බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් ස්වකීය තීරණයෙහි නියම කරනු ලැබිය හැකි ය.

බේරුම්කරුවන්ගේ වන්දි.

29. (1) බේරුම්කාර විනිශ්චයාධිකාරය සංස්ථාපනය වන බේරුම් කරුවන්ට, ඔවුන්ගේ වැඩ සහ වියදම් සඳහා සාධාරණ වන්දියක් ගෙවීමට පාර්ශ්වකරුවෝ එක්ව හා වෙන් වෙන්ව යටත් වන්නාහ:

එසේ වුව ද, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් සිය තිරණයෙහි, ආරාවුල ගැන තිරණය කිරීමට ඊට අධිකරණ බලය නැත්තේ යයි ප්‍රකාශ කරන විට, බේරුම් කිරීම ඉල්ලා නොසිටි පාර්ශ්වකරුට වන්දි ගෙවීම අවශ්‍ය කෙරෙන අති විශේෂ අවස්ථාගත කරුණු ඇත්තේ නම් පමණක්, ඔහු ඒ වන්දි ගෙවීමට යටත් විය යුතු ය.

(2) තිරණය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට එක් මාසයක කාල යක් ඉකුත් වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, එක් එක් මුදල් ප්‍රමාණය මත ගණන් බලන ලද නෛතික පොලිය ද සමඟ තිරණයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් මුදලක් එසේ සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය වන එක් එක් බේරුම්කරුට ගෙවන ලෙස අවසාන තිරණයෙහි නියම කරනු ලැබිය යුතු ය.

(3) බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය වන බේරුම්කරුවන්ට වන්දි ගෙවීම සඳහා නියමයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කරන ලබන යම් මුදලක ඇප තැන්පතු එසේ සඳහන් කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත පාර්ශ්වකරුවන් විසින් ගෙවන ලෙස බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් නියම කරනු ලැබිය හැකි ය. සහාය සඳහා ව එක් එක් ඉල්ලීම වෙනුවෙන් වෙන වෙනම වූ ඇප තැන්පතු නියම කරනු ලැබිය හැකි ය.

(4) තැන්පතු හෝ ඇප ගෙවීම සඳහා වූ නියමයෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් නියම කරන ලද ඇප තැන්පතුවේ ස්වකීය කොටස ගෙවීම පාර්ශ්ව කරුවකු පැහැර හරින අවස්ථාවක, අනිත් පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් විසින් නියම කරන ලද මුළු තැන්පත් මුදල හෝ ඇප මුදල ගෙවනු ලැබිය හැකි ය.

(5) තැන්පතු හෝ ඇප ගෙවීම සඳහා නියමයෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් නියම කරන ලද ඇප තැන්පතුව කිසිම පාර්ශ්වකරුවකු විසින් ගෙවා නො මැති අවස්ථාවක, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් බේරුම් කිරීමේ නීති කෘත්‍ය අවසන් කරනු ලැබිය හැකි ය.

(6) බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය වන බේරුම්කරුවන් විසින්, බේරුම් කිරීමේ නීති කෘත්‍ය පවත්වාගෙන යන අතර තුර ඔවුන්ගේ වියදම් පියවීමේ කාර්යය සඳහා, ඒ තැන්පත් මුදල් හෝ ඇප මුදල් ලබා ගත හැකි ය.

බේරුම්කරුගේ තීරණය අත් හිටවනු නොලැබිය යුතු බව.

30. බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය වන බේරුම්කරුවන්ට ගෙවිය යුතු වන්දි මුදල් ගෙවීම කරන තුරු, බේරුම්කාර විනිශ්චයාධිකාරයක් විසින් සිය තීරණය ප්‍රකාශ කිරීම අත් හිටවනු නොලැබිය යුතු ය.

## VII වන කොටස

### තීරණවලට අදාළව අධිකරණ වෙත කරනු ලබන ඉල්ලීම් (විදේශ තීරණ පිළිගැනීම හා බලාත්මක කිරීම ඇතුළුව)

තීරණය ඉදිරිපත් කිරීම හා බලාත්මක කිරීම සඳහා ඉල්ලීම.

31. (1) බේරුම්කාර තීරණයක් කරනු ලැබුවේ යම් බේරුම් කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව ද ඒ බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවකු විසින්, තීරණය කිරීමෙන් දින දාහතරක් ඉකුත් වීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත තීරණය බලාත්මක කිරීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) තීරණයක් බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක්—

(අ) තීරණයේ මුල් පිටපත හෝ ඒ තීරණයේ යථා පරිදි සහතික කරන ලද පිටපතක් ; සහ

(ආ) තීරණය කරන ලද්දේ යයි අදහස් කරනු ලබන්නේ යම් මුල් බේරුම් කිරීමේ ගිවිසුමක් යටතේ ද ඒ මුල් බේරුම් කිරීමේ ගිවිසුම හෝ ඒ ගිවිසුමේ යථා පරිදි සහතික කළ පිටපතක්

සමග විය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, තීරණයේ හෝ බේරුම් කිරීමේ ගිවිසුමේ පිටපතක්—

(i) ඒ පිටපත බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් හෝ ඒ විනිශ්චයාධිකාරයේ සාමාජිකයකු විසින් සහතික කරන ලද බවට අදහස් කරනු ලබන්නේ නම් සහ ඇත්ත වශයෙන්ම එය එසේ සහතික කර ඇති බවට අධිකරණයට පෙන්වා දී නොමැති නම්; හෝ

(ii) ඒ පිටපත අධිකරණය සෑහීමට පත්වන ආකාරයට අන්‍යාකාරයෙන් සහතික කර ඇත් නම්

එය යථා පරිදි සහතික කරනු ලැබ ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ලේඛනයක් හෝ ලේඛනයක කොටසක් අධිකරණයේ රාජ්‍ය භාෂාවෙන් හෝ ඉංග්‍රීසියෙන් හැර වෙනත් භාෂාවකින් ලියා ඇත් නම් අවස්ථාවෝචිත පරිදි ඒ ලේඛනයේ හෝ ඒ කොටසේ ඒ රාජ්‍ය භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් වූ නිවැරදි පරිවර්තනයක් බවට සහතික කරන ලද පරිවර්තනයක් ඒ ලේඛනය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, පරිවර්තනයක් නිලධරයකු විසින් හෝ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු විසින් හෝ තීරණය කරනු ලැබූ රටේ ශ්‍රී ලංකාවෙහි සිටින රාජ්‍ය දූතයකු හෝ කොන්සල් නියෝජිතයකු විසින් නැතහොත් අධිකරණය සෑහීමට පත් වන පරිදි අන්‍යාකාරයෙන් සහතික කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය අනුව අධිකරණයට ඉදිරිපත් කරන ලද ලේඛනයක්, ඒ ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු, එය අදාල වන කාරණා පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂියක් වශයෙන් අධිකරණය විසින් පිළිගනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ 32 වන වගන්තිය යටතේ ඒ තීරණය ඉවත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක හෝ මේ පනතේ 33 වන හා 34 වන වගන්තිවල ඇතුළත් විධිවිධාන යටතේ තීරණය පිළිගැනීම සහ බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම පිණිස හේතුවක් නොමැති බව අධිකරණයට පෙනී යන අවස්ථාවක පාර්ශ්වකරුවන්ට දැනුම් දිය යුතු දිනයක දී අධිකරණය විසින් තීරණය ගොනු කිරීමට හා තීරණය අනුව නඩු තීන්දුව දීමට ක්‍රියා කළ යුතුය. නඩු තීන්දුව එසේ දෙනු ලැබූ විට තීන්දු ප්‍රකාශය ඇතුලත් කරනු ලැබිය යුතු ය.

බේරුම්කාර තීරණය ඉවත් කිරීම සඳහා ඉල්ලීම.

32. (1) තීරණය ලැබී දින හැටක් ඇතුළත තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද බේරුම් කිරීමක දී කරන ලද බේරුම්කාර තීරණයක්—

(අ) ඉල්ලීම කරන පාර්ශ්වකරු විසින්—

(i) බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවකු යම් අශක්නුතාවකට පත්ව සිටි බවට හෝ පාර්ශ්වකරුවන් විසින් ඒ ගිවිසුම යටත් කළේ යම් නීතියකට ද ඒ

නීතිය යටතේ ඒ ගිවිසුම වලංගු නොවන බවට හෝ ඒ ප්‍රශ්නය මත යම් හැඟවීමක් කර නොමැති විට, ඒ ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වලංගු නොවන බවට සාධක ඉදිරිපත් කරන අවස්ථාවක, මහාධිකරණය විසින් ඉවත් කරනු ලැබිය හැකි ය; හෝ

(ii) ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වකරුට බේරුම්කරුව කගේ පත් කිරීම පිළිබඳව හෝ බේරුම් කරුවේ නීති කෘත්‍ය පිළිබඳව නිසි දැන්වීමක් දෙනු නො ලැබූ බවට හෝ අන්‍යාකාරයෙන් ඔහුගේ නියාපෑම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවට සාධක ඉදිරිපත් කරන අවස්ථාවක, මහාධිකරණය විසින් ඉවත් කරනු ලැබිය හැකි ය; හෝ

(iii) තීරණය, බේරුම් කිරීමට ඉදිරිපත් කළ නියම වලින් අදහස් නොකළ හෝ ඒ නියමවලට අයත් නොවන ආරාවුලක් අශ්‍රිතව කරන ලද්දක් බවට හෝ ඒ තීරණයෙහි බේරුම් කිරීමට ඉදිරිපත් කළ නියමවල විෂය පථය ඉක්මවා ගිය කාරණා සම්බන්ධයෙන් වූ තීරණ ඇතුළත් බවට සාධක ඉදිරිපත් කරන අවස්ථාවක, මහාධිකරණය විසින් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, බේරුම් කිරීමට ඉදිරිපත් කළ කාරණා මත කර ඇති තීරණය, එසේ ඉදිරිපත් නොකළ කාරණාවලින් වෙන් කිරීමට හැකි නම්, බේරුම් කිරීමට ඉදිරිපත් නොකළ කාරණා මත කර ඇති තීරණ ඇතුළත් තීරණයේ ඒ කොටස පමණක් ඉවත් කරනු ලැබිය හැකි ය; හෝ

(iv) පාර්ශ්වකරුවන්ගේ ගිවිසුම මේ පනතේ විධිවිධාන සමඟ ඝට්ටනය වේ නම් මිස, බේරුම්කාර විනිශ්චයාධිකාරයේ සංයුතිය හෝ බේරුම්කාර කාර්ය පටිපාටිය පාර්ශ්වකරුවන්ගේ ගිවිසුමට අනුකූල නොවන බවට හෝ එවැනි ගිවිසුමක් නොමැති විට, එය මේ පනතට අනුකූල නොවන බවට සාධක ඉදිරිපත් කරන අවස්ථාවක මහාධිකරණය විසින් ඉවත් කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) මහාධිකරණය විසින්—

(i) ආරාවුලේ විෂය කාරණය, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ බේරුම් කිරීමේ මාර්ගයෙන් සමථයකට පත් කිරීමට හැකි කාරණයක් නොවන බවට; හෝ

(ii) බේරුම්කාර තීරණය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය සමග ඝට්ටනය වන බවට

තීරණය කරන අවස්ථාවක, මහාධිකරණය විසින් තීරණය ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) තීරණයක් ඉවත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඉල්ලීම පිළිබඳව නිශ්චයක් කරනු ලබන තෙක්, ගෙවිය යුතු බවට තීරණය මගින් නියම කර ඇති යම් මුදලක් අධිකරණයට ගෙනෙන ලෙස හෝ අන්‍යාකාරයෙන් සුරක්ෂිත කරන ලෙස මහාධිකරණය විසින් ආඥා කළ හැකි ය.

විදේශ බේරුම්කාර තීරණ පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.

33. විදේශ බේරුම්කාර තීරණයක්, ඒ තීරණය කරන ලද්දේ කවර රටක දී වුවද ඒ ගැන නොසලකා, 34 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තීරණය අනුගම්‍ය වන්නේ යයි පිළිගත යුතු අතර, 31 වන වගන්තිය යටතේ පාර්ශ්වකරුවකු විසින් මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, එවැනි තීරණයක් ඒ වගන්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය අධිකරණයේ ගොනු කිරීම මගින් ක්‍රියාත්මක කළ යුතු ය.

පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු.

34. (1) තීරණය කරන ලද්දේ කවර රටක දී වුවද ඒ ගැන නොසලකා විදේශ බේරුම්කාර තීරණයක් පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම පහත සඳහන් අවස්ථාවල දී පමණක්, එනම්—

(අ) ඒ තීරණය අයැද සිටිනු ලබන්නේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ද, ඒ පාර්ශ්වකරු විසින්, පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කර සිටින අධිකරණය වෙත—

(i) බේරුම්කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවකු යම් අශක්තතාවකට පත්ව සිටි බවට හෝ පාර්ශ්වකරුවන් විසින් ඒ ගිවිසුම යටත් කළේ යම් නීතියකට ද ඒ නීතිය යටතේ ඒ ගිවිසුම වලංගු නොවන බවට හෝ පාර්ශ්වකරුවන් විසින් ඒ ගිවිසුම යටත් කර ඇත්තේ යම් නීතියකට ද ඒ නීතිය මත යම් හැඟවීමක් කර නොමැති විට, ඒ ගිවිසුම, තීරණය කරන ලද රටේ නීතිය යටතේ වලංගු නොවන බවට සාධක ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ පාර්ශ්වකරුවකුට විරෝධතාව මත ; හෝ

(ii) තීරණය අයැද සිටිනු ලබන්නේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ද ඒ පාර්ශ්වකරුට බේරුම්කරුවකු පත් කිරීම පිළිබඳව හෝ බේරුම් කිරීමේ නීති කාත්‍ය පිළිබඳව නිසි දැන්වීමක් කරනු නොලැබ බවට හෝ අන්‍යාකාරයෙන් ඔහුගේ කියාපෑම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවට සාධක ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ පාර්ශ්වකරුගේ විරෝධතාව මත ; හෝ

(iii) තීරණය බේරුම් කිරීමට ඉදිරිපත් කළ නියමවලින් අදහස් නොකළ හෝ නියමවලට අයත් නොවන ආරාවුලක් ආශ්‍රිතව කරන ලද්දක් බවට හෝ තීරණයෙහි බේරුම් කිරීමට ඉදිරිපත් කළ නියමවල විෂය පථය ඉක්මවා ගිය කාරණා සම්බන්ධයෙන් වූ තීරණ ඇතුළත් බවට සාධක ඉදිරිපත් කරනු ලැබුව හොත් ඒ පාර්ශ්වකරුගේ විරෝධතාව මත ;

එසේ වුවද, බේරුම් කිරීමට ඉදිරිපත් කළ කාරනා මත කර ඇති තීරණය, එසේ ඉදිරිපත් නොකළ කාරණාවලින් වෙන් කළ හැකි නම්, බේරුම් කිරීමට ඉදිරිපත් කළ කාරණා මත කර ඇති තීරණයක් ඇතුළත් තීරණයේ ඒ කොටස පිළිගෙන ක්‍රියාත්මක කළ හැකි ය ; හෝ

(iv) බේරුම්කාර විනිශ්චයාධිකාරයේ සංයුතිය හෝ බේරුම්කාර නිති කෘත්‍ය පාර්ශ්වකරුවන්ගේ ගිවිසුමට අනුකූල නොවන බවට හෝ එවැනි ගිවිසුමක් නොමැති විට, ඒ සංයුතිය හෝ කාර්ය පටිපාටිය බේරුම් කිරීම සිදු වූ ස්ථානය පිහිටි රටේ නීතියට අනුකූල නොවන බවට සාධක ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ පාර්ශ්වකරුගේ විරෝධතාව මත ; හෝ

(v) තීරණය තවමත් පාර්ශ්වකරුවන් විෂයයෙහි අනුගම්‍ය නොවන බවට හෝ ඒ තීරණය කරන ලද රටේ අධිකරණයක් විසින් හෝ ඒ රටේ නීතිය යටතේ හෝ ඉවත් කර ඇති බවට හෝ අත්හිටුවා ඇති බවට සාධක ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ පාර්ශ්වකරුගේ විරෝධතා මත ; හෝ

ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය ; හෝ

(ආ) (i) ආරාවුලේ විෂය කාරණය, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ බේරුම් කිරීමේ මාර්ගයෙන් සමථයකට පත් කිරීමට හැකි කාරණයක් නොවන බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් ; හෝ

(ii) තීරණය පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන්නේ යයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්

ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) තීරණයක් ඉවත් කිරීම හෝ අත්හිටුවීම සඳහා වූ ඉල්ලීමක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (v) වන අනුඡේදයේ සඳහන් කර ඇති හේතු මත අධිකරණයක් වෙත කර ඇත්නම්, පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම ඉල්ලා සිටිනු ලබන්නේ යම් අධිකරණයකින් ද, ඒ අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන්නේ නම්, එහි තීරණය අඩාළව කල් තැබිය හැකි අතර, තීරනය පිළිගන්නා ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටින පාර්ශ්වකරුගේ ඉල්ලීම මත උචිත ඇප සපයන ලෙස අනික් පාර්ශ්වකරුට ආඥා කළ හැකි ය.

35. (1) තීරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ තීරණයක් ඉවත් කිරීම සඳහා, අධිකරණයෙහි ගොනු කරන ලද ඉල්ලීම විනිශ්චයට භාජනයව පවත්නා අවස්ථාවක අධිකරණය විසින් ඒ ඉල්ලීම ඒකාබද්ධ කළ යුතු ය.

තීරණයක් ඉවත් කිරීම සඳහා වූ ඉල්ලීමක්. තීරණයක් ගොනු කිරීම සඳහා වූ ඉල්ලීමක් සමග ඒකාබද්ධ කිරීමට ඇති බලය.

(2) තීරණය ඉවත් කිරීම සඳහා 32 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, 34 වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් කවර හෝ හේතුවක් මත තීරණය ක්‍රියාත්මක කිරීමෙහි ලා විරෝධය දැක්වීමට බේරුම් කිරීමක පාර්ශ්වකරුවකුට අධිකරණය විසින් අවසර දෙනු නොලැබිය යුතු ය.

36. (1) බේරුම්කාර විනිශ්චයාධිකාරයකට බේරුම් කිරීමේ නීති කෘත්‍ය නැවත ආරම්භ කිරීමට හැකිවනු පිණිස හෝ තීරණය අවලංගු කිරීම සඳහා ඇති හේතු අපහරණය කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීම පිණිස මහාධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් කාලයක් සඳහා තීරණයක් ඉවත් කිරීම පිණිස වූ ඉල්ලීමක් නතර කරන ලෙස මහාධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

බේරුම්කාර විනිශ්චයාධිකාරයට ආපසු යැවීම.

(2) මහාධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක්—

(අ) ඒ ආඥාව කරන ලෙස බේරුම් කිරීමේ සියලු පාර්ශ්වකරුවන් විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්; හෝ

(ආ) ඒ බේරුම් කිරීමේ එක් පාර්ශ්වකරුවකු විසින් ඒ ආඥාව කරන ලෙස ඉල්ලා සිටිනු ලබන්නේ නම් සහ තීරණය අවලංගු කිරීම පිණිස හේතු තිබෙන බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්

මිස, කරනු නොලැබිය යුතු ය.

37. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, මේ පනතේ මේ කොටස යටතේ මහාධිකරණයේ ආඥාවකට, තබු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව හැර, මේ පනත යටතේ වූ මහාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී මහාධිකරණය විසින් කරනු ලබන යම් ආඥාවකට තබු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් නොතිබිය යුතු ය.

අභියාචනා

(2) නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත පමණක් සහ පළමුව ලබාගත් ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ඇතිව, (1) වන උපවගන්තියෙහි සඳහන් මහාධිකරණයේ ආඥාවකට, තබු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව මහාධිකරණයේ ආඥාව, තබු තීන්දුව හෝ තීන්දු ප්‍රකාශය ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) තීරණයකට අදාළව අභියාචනය කිරීමේ යම් අයිතියක් බැහැර කිරීම පිණිස බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවන් විසින් (මෙහි මින් මතු "බැහැර කිරීමේ ගිවිසුම" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිවිසුමකට ලියවිල්ලකින් එකඟ විය හැකි ය.

බැහැර කිරීමේ ගිවිසුම.

38. (1) අභියාචනය කරනු ලබන තීරණයට අදාළව, බේරුම් කිරීමේ ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර බැහැර කිරීමේ ගිවිසුමක් බලාත්මකව පවතී නම්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, කවර කරුණක් හෝ නිසා, 37 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයකට අවසර දෙනු නොලැබිය යුතු ය.

(2) බැහැර කිරීමේ ගිවිසුමක්, එම බේරුම් කිරීමේ ගිවිසුමෙන් පැන නැගුනේ වුව ද නොවූව ද, විශේෂ තීරණයකට, විශේෂ බේරුම් කිරීමේ ගිවිසුමක් යටතේ වූ තීරණවලට හෝ වෙනත් විස්තරයක තීරණවලට අදාළ වන ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) ගිවිසුමක්, ඒ ගිවිසුමට එළඹියේ නියමිත දිනයට පෙර හෝ පසුව වුව ද, එසේම ඒ ගිවිසුම එය බේරුම් කිරීමේ ගිවිසුමක කොටසකින් සැදුම්ලත් වුව ද නොවුව ද, මේ වගන්තියේ කාර්ය සඳහා බැහැර කිරීමේ ගිවිසුමක් විය හැකි ය.

හිමිකමක් සඳහා නඩු පැවරීමේ ප්‍රමාදය.

39. (1) ගිවිසුම් අදාළවන ආරවුලක් පැන නැගුන අවස්ථාවක, හිමිකම්පෑමක් සඳහා නඩු පැවරීමෙහි ලා නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කිරීම හිමිකම්පාන්නාගේ කාර්ය විය යුතු බව, බේරුම් කිරීමේ ගිවිසුමේ ව්‍යංග කොන්දේසියක් විය යුතු ය.

(2) බේරුම් කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව හිමිකම් පෑමක් සඳහා නඩු පැවරීමේ දී හිමිකම්පාන්නකුගෙන් අනිසි ප්‍රමාදයක් සිදුවී ඇති අවස්ථාවක් වේ නම්, එවිට, ආරාවුලට සම්බන්ධ යම් පාර්ශ්ව කරුවකුගේ ඉල්ලීම පිට, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින්, බේරුම් කිරීමේ නීති කෘත්‍ය අවසන් කරමින් නියමයක් කළ හැකි ය.

(3) බේරුම්කාර විනිශ්චයාධිකාරය—

(අ) ප්‍රමාදය යේනානුකූල නොවන අසාමාන්‍ය බවට; හෝ

(ආ) ප්‍රමාදයෙන්, බේරුම් කිරීමේ නීති කෘත්‍යයෙහි දී විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳව සාධාරණ නිශ්චයකට එළඹීමට නොහැකිවීමේ සැලකිය යුතු අවදානමක් උද්ගත වන බවට හෝ ඒ ප්‍රමාදයෙන්, බේරුම් කිරීමේ නීති කෘත්‍යයෙහි අනික් පාර්ශ්වකරුවන්ට ඔවුනොවුන් අතර සහ හිමිකම්පාන්නා අතර හෝ ඒ එක් එක් අයකු අතර හෝ ඒ පාර්ශ්වකරුවන් සහ තුන්වන පාර්ශ්වකරුවන් අතර හෝ යන එක් ආකාරයකින් බේරුම් කිරීමේ නීති කෘත්‍යවලින් බැහැරව හානියක් සිදුවීමට ඉඩ ඇති බවට හෝ එසේ බැවින් හානියක් සිදු වී ඇති බවට

සෑහීමට පත්වන්නේ නම් මිස, බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් (2) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු නොලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් මත කරන ලද බේරුම්කාර විනිශ්චයාධිකාරයගේ යම් නියමයකින් අතෘප්තියට පත් පාර්ශ්වකරුවකු විසින් එයට විරුද්ධව මහාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි ය.

## VIII වන කොටස

### මහාධිකරණය හමුවේ කාර්ය පටිපාටිය

කාර්ය පටිපාටිය.

40. (1) අභියාචන ආකාරයෙන් වුවද නැතහොත් අන්‍යාකාරයෙන් වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ මහාධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම, පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් විය යුතු අතර, පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හැර, බේරුම් කිරීමේ සියලු පාර්ශ්වකරුවන් ඒ පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කළ යුතු ය; තව ද ඒ ඉල්ලීම පිළිබඳ ඔවුන් වෙත දැන්වීම් කළ යුතු ය.

(2) පෙත්සම සහ දිවුරුම් ප්‍රකාශය අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණය විසින්, ආඥාවක් මගින් පෙත්සමේ කාරණය ගැන තීරණය කිරීම සඳහා දිනයක් නියම කළ යුතු අතර, පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති පාර්ශ්වකරුවන්ට, ඔවුන්ගේ විරෝධතා කිසිවක් වේ නම්, ඒ විරෝධතා දිවුරුම් ප්‍රකාශයකින් තහවුරු කරන ලියවිල්ලක් මගින් ප්‍රකාශ කර සිටීම පිණිස දිනයක් දිය යුතු ය; තවද විරෝධතාවලට පිටපතක් පෙත්සම්කරුවන්ට ලබාගැනීමට සැලැස්විය යුතු ය.

(3) මහාධිකරණය ඉදිරියෙහි නඩු කටයුතුවල දී දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂි දිය යුතු ය. එහෙත් දිවුරුම් ප්‍රකාශය මගින් සාක්ෂි ලබා ගැනීමට අතිරේකව, වාචිකව ද සාක්ෂි ලබා ගැනීම නිවැරදි යයි අධිකරණය කල්පනා කරන අවස්ථාවක, අධිකරණය විසින් එසේ කළ හැකි ය.

(4) මහාධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කර හැකිතාක් ඉක්මණින් ඒ ඉල්ලීම පිළිබඳ එහි තීරණය ප්‍රකාශයට පත් කළ යුතු ය.

බලාත්මක කිරීම.

41. 31 (6) වන වගන්තියේ විධිවිධාන යටතේ තීරණයක් අනුව නඩු තීන්දුවක් දී තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කර ඇති අවස්ථාවක, ඒ තීන්දු ප්‍රකාශය (101 වන අධිකාරය වන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ වූ තීන්දු ප්‍රකාශයක් බලාත්මක කරන ආකාරයෙන් ම බලාත්මක කළ යුතු අතර ඒ අනුව, තීන්දු ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීමට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එය බලාත්මක කිරීමට අදාළ විය යුතු ය.

**42.** මේ පනත යටතේ යම් තැනැත්තකු වෙත දැන්වීමක් හෝ සිතාසි භාර කිරීම නියම කර හෝ අවසර දී ඇති අවස්ථාවක, ඒ දැන්වීම හෝ සිතාසි—

*දැන්වීම හා සිතාසි භාර කිරීම.*

(අ) ඒ තැනැත්තාගේ සාමාන්‍ය හෝ අවසන් වරට දැන සිටි පදිංචි ස්ථානයේ දී හෝ ව්‍යාපාරික ස්ථානයේ දී භාර දීම සඳහා ඒ තැනැත්තා අමතා ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමෙන් ;

(ආ) එහි සඳහන් දිනයේ දී ඒ තැනැත්තා විසින් පෙනී සිටීමක් නොකරන ලද්දේ නම් පිස්කල්වරයාගේ මාර්ගයෙන් එය ඔහු වෙත පුද්ගලිකව භාරදීමෙන් ; සහ

(ඇ) දැන්වීම හෝ සිතාසි භාර ගැනීම ඒ තැනැත්තා විසින් හිතා මතාම මගහරින්නේ නම්, (101 වන අධිකාරය වන) සිවිල් නඩුවිධාන සංග්‍රහයේ විධිවිධාන අනුව ආදේශිත භාරදීමේ ක්‍රමයට එය භාරදීමෙන්

ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී භාර කරනු ලැබිය හැකි ය.

**43.** ශ්‍රේෂ්ඨාධිකරණය විසින්—

*ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති.*

(අ) මේ පනත යටතේ යම් අධිකරණයක් වෙත යම් ඉල්ලීමක් හෝ අභියාචනයක් කිරීම සහ ඒ ඉල්ලීමේ හෝ අභියාචනයේ ගාස්තු ;

(ආ) බේරුම් කිරීමේ ගිවිසුම් අදාළ වන හිමිකම් පෑමක් ඉටු කිරීමේ දී අධිකරණය වෙත සහ අධිකරණයෙන් කරනු ලබන, මුදල් ගෙවීම් සහ ඒ මුදල් ආයෝජනය කිරීම ;

සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

**44.** යම් නඩුවක කාර්යය සඳහා කාලාවරෝධවීමේ කාලය ගණනය කිරීමේ දී බේරුම් කිරීමක් ආරම්භ කිරීම සහ අවස්ථෝචිත පරිදි එය සම්පූර්ණ කිරීම හෝ අවසාන කිරීම අතරතුර ගෙවී ගිය කාලය බැහැර කරනු ලැබිය යුතු ය.

*කාලය ගණනය කිරීම.*

## IX වන කොටස

### බේරුම් කිරීමකට අදාළ පොදු විධිවිධාන

**45.** බේරුම්කරුවකුගේ තත්ත්වයෙන් බේරුම්කරුවකු විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වූ නොසැලකිලිමත්කම සඳහා බේරුම්කරුවකු වගකිව යුතු නොවන නමුත්, ඒ තත්ත්වයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වූ වංචාවක් සඳහා ඔහු වගකිව යුතු ය.

*බේරුම්කරුවකුගේ වගකීම.*

**46.** (1) බේරුම් කිරීමේ ගිවිසුමේ පටහැනි අදහසක් ප්‍රකාශ කර ඇත්නම් මිස, බේරුම් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වකරුවකු මිය ගිය අවස්ථාවක, ඒ පාර්ශ්වකරුගේ මියයාම නිසා ගිවිසුම අවලංගු නොවිය යුතු අතර එයින් බේරුම්කාර විනිශ්චයාධිකාරය ස්ථාපනය කරන බේරුම්කරුවන්ගේ අධිකාරය ප්‍රත්‍යාදිෂ්ට නොවිය යුතු ය; එහෙත් මියගිය තැනැත්තාගේ නීත්‍යනුකූල නියෝජිතයා විසින් හෝ ඔහුට විරුද්ධව ගිවිසුම බලාත්මක කරනු ලැබිය යුතු ය.

පාර්ශ්වකරුවකු මිය යාම.

(2) යම් තැනැත්තකුගේ මියයාමෙන් නඩු පැවරීමේ අයිතිවාසිකම යම් ප්‍රඥප්තියක හෝ නීතියේ රීතියක බලය ප්‍රකාර අහෝසි වන්නේ ද, ඒ ප්‍රඥප්තිය හෝ නීතියේ රීතිය ක්‍රියාත්මකවීම කෙරෙහි (1) වන උපවගන්තියේ ඇතුළත් කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය.

**47.** (1) (98 වන අධිකාරය වන) බේරුම් කිරීමේ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ඉවත් කිරීම.

(2) (101 වන අධිකාරය වන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 693 වන වගන්තියේ සිට 698 වන වගන්තිය තෙක් වූ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

**48.** සැක දුරු කිරීමේ කාර්යය සඳහා මේ පනතේ කිසිවක් කාර්මික ආරාවුල් පනත යටතේ හෝ බේරුම් කිරීම සඳහා විශේෂ විධිවිධාන සලසන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත හැර වෙනත් යම් නීතියක් යටතේ කරනු ලබන බේරුම් කිරීමේ නීති කෘත්‍යයන් කෙරෙහි මේ පනතේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

බේරුම් කිරීම සඳහා විධිවිධාන සලස්වන වෙනත් නීතිවලට අදාළ කිරීම.

**49.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**50.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"බේරුම් කිරීමේ ගිවිසුම" යන්නෙන්, ගිවිසුම්ගත වුවද නොවුව ද, නිශ්චිත නෛතික සම්බන්ධතාවක් සම්බන්ධයෙන්, බේරුම් කිරීමට ඉදිරිපත්ව ඇති පාර්ශ්වකරුවන් අතර පැන නැගී ඇති හෝ පැන නැගීමට ඉඩ ඇති සියලු හෝ ඇතැම් ආරාවුල් බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ඒ පාර්ශ්වකරුවන් විසින් එළඹ ඇති ගිවිසුමක් අදහස් වේ;

"බේරුම් කිරීම" යන්නෙන්, ස්ථිර බේරුම්කාර ආයතනයක් විසින් ක්‍රියාවෙහි යොදවනු ලැබූ හෝ නොලැබූ යම් බේරුම් කිරීමක් අදහස් වේ;

"බේරුම්කාර විනිශ්චයාධිකාරය" යන්නෙන්, එක් බේරුම්කරුවකුගෙන් හෝ ඊට වැඩි දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයක් අදහස් වේ;

"තීරණය" යන්නෙන්, ආරාවුලේ හරය මත බේරුම්කාර විනිශ්චයාධිකාරය විසින් කරන ලද තීරණයක් අදහස් වේ;

"විදේශ බේරුම්කාර තීරණය" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත දී පවත්වන ලද බේරුම් කිරීමක් මගින් කරනු ලැබ ඇති තීරණයක් අදහස් වේ;

"මහාධිකරණය" යන්නෙන්, කොළඹ අධිකරණ කලාපයෙහි පවත්වනු ලබන හෝ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අග්‍ර විනිශ්චයකාරවරයා විමසා අමාත්‍යවරයා විසින් නාමෝද්දිෂ්ට කරනු ලැබිය හැකි වෙනත් යම් කලාපයක පවත්වනු ලබන හෝ, ශ්‍රී ලංකාවේ මහාධිකරණය අදහස් වේ.

"නෛතික පොලිය" යන්නෙන්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 192 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක නිශ්චිතව සඳහන් අනුපාතය අනුව වූ ද, තත්කාලයෙහි බලපවත්නා වූ ද පොලිය අදහස් වේ;

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 670 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත ලබන වර්ෂයෙහි දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය